ස්වදේශ කටයුතු චක්‍රලේඛ - 01/2023

මගේ අංකය : HA /02/26/05/03
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත්
සභා හා පළාත් පාලන අමාත්‍යාංශය,
"නිල මැදුර",
ඇල්විටිගල මාවත,
කොළඹ 05.
2023.01.10

සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්,
සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්,
සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්,

**<u>සම්පත් පැතිකඩ ඩිජිටල්කරණය කිරීම</u>**

ප්‍රදේශයේ පවත්නා වූ සම්පත් නිසි පරිදි හඳුනා ගනිමින් එය කළමනාකරණය පහසු වීම සඳහා පළාත් සභා මට්ටමින්, දිස්ත්‍රික් ලේකම් කාර්යාල මට්ටමින් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් "සම්පත් පැතිකඩ" වාර්තාව සකස් කිරීම දැනටමත් සිදු කරනු ලබයි. මේ සඳහා යෙදී සිටින නිලධාරීන්ගේ කැපවීම හා උනන්දුව මත මාර්ගගතව තොරතුරු ලබාගත හැකි පරිදි විවිධ මට්ටමින් තොරතුරු කළමණාකරණ පද්ධති පවත්වාගෙන ගියද, පරිහරණය කරන්නාගේ පහසුව උදෙසා විද්‍යාත්මක පදනමකින් දත්ත වර්ගීකරණය, අවශ්‍ය පුද්ගලයින්ට පමණක් එම දත්ත පරිහරණයට ගැනීමේ හැකියාව ද ඇති පරිදි ඒකාබද්ධ තොරතුරු පද්ධතියක් පවත්වාගෙන යාම අත්‍යාවශ්‍ය බව හඳුනාගෙන ඇත.

2. ස්වදේශ කටයුතු විෂය භාර අමාත්‍යාංශය විසින් පසුගිය කාලය තුළ සම්පාදනය කරන ලද "සම්පත් පැතිකඩ" මධ්‍යගත දත්ත පද්ධතියක් තුළ යාවත්කාලීන කිරීමටත්, එය ඩිජිටල් වේදිකාවකට මුදාහැරීමටත් තීරණය කර ඇත. ඒ සඳහා www.resourceprofile.gov.lk යන වෙබ් අඩවිය හරහා මෙම ඩිජිටල් දත්ත පද්ධතිය හා සම්බන්ධ විය හැක.

3. මෙහිදී, අමාත්‍යාංශ, පළාත් සභා, දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල බිම් මට්ටමේ සිටම "සම්පත් පැතිකඩ" සම්මත ආකාරයෙන් සැකසීමටත්, ඒවාට වගකිව යුතු නිලධාරීන් හඳුනා ගැනීමටත් අවශ්‍ය වේ. විධිමත්ව මෙම කාර්යය ක්‍රියාත්මක කිරීමේදී පහත සඳහන් උපදෙස් හා විධිවිධාන අනුගමනය කළ යුතු බව අවධාරණය කරමි ;

3.1 නිශ්චිත මාණ්ඩලික නිලධාරියා ලෙස ප්‍රදේශීය ලේකම් කාර්යාලයේ නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) වෙත වගකීම පැවරීම.

3.2 නිත්‍ය සහාය නිලධාරීන් ලෙස මෙම කාර්යය පිළිබඳ මනා දැනුමක් හා පරිචයක් සහිත ආර්ථික සංවර්ධන නිලධාරියකු පත් කිරීම හා ඒ සඳහා සංඛ්‍යා ලේඛන නිලධාරීන්ගේ ද සහාය ලබාදීම.

3.3 ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවය කරන සියළුම ක්ෂේත්‍ර නිලධාරීන් විසින් තම විෂයය පථය යටතේ කළමනාකරණය කිරීමට අපේක්ෂිත තොරතුරු 'ජාතික සම්පත් පැතිකඩ' දත්ත පද්ධතියට ඇතුලත් කළ හැකි පරිදි තොරතුරු ලබාදීම.

3.4 ඒ සඳහා එම නිලධාරීන්ට තම විෂයය පථයට අනුකූලව මාර්ගගත පිවිසුම් සකස් කර ගත හැක. එම නිලධාරීන්ගේ දත්ත පිවිසුම් සකස් කිරීම හා පරිපාලනය මේ වනවිට තොරතුරු සම්බන්ධීකරණ නිලධාරී හෝ ආයතන ප්‍රධානී නම් කරන වෙනත් සුදුසු නිලධාරියෙකු විසින් සිදු කළ යුතුය.

3.5 දත්තවල ස්වරූපය අනුව අදාළ දත්ත යාවත්කාලීන කරනු ලබන කාල වකවානුව හඳුනා ගැනීම. (සතිපතා, මාසිකව, ත්‍රෛමාසික හා වාර්ෂික ආදී වශයෙන්)

3.6 ඉදිරියේදී දත්ත වර්ගීකරණයට අනුව ඒ ඒ අංශයේ දත්තවල වගකීම දරනු ලබන ආයතන ප්‍රධානියා හඳුනා ගැනීම කළ යුතුය.
(උදා: පාසල් ආශ්‍රිත දත්ත: කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ, සෞඛ්‍ය දත්ත: ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා නිලධාරී)

3.7 පළාත් සභා හා පළාත් පාලන ආයතනවල සක්‍රිය දායකත්වය මෙම කාර්යය සඳහා අත්‍යාවශ්‍ය වේ.

4. <u>දත්ත පරිශීලක පිවිසුම්</u>

4.1 2023 ජනවාරි 30 ට පෙර පද්ධතිය සම්බන්ධයෙන් අවශ්‍ය පුහුණු කිරීම් හා දැනුවත් කිරීම්ද සිදු කර, පද්ධතිය වෙත දත්ත ඇතුලත් කිරීම ආරම්භ කළ යුතුය.

4.2 සියළුම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා අනෙකුත් රාජ්‍ය ආයතන සඳහා දත්ත පරිශීලනය කිරීම සඳහා පද්ධති පිවිසුම් (System Access Accounts) සකස් කර ගත හැක. මේ යටතේ ලියාපදිංචි වන සියළුම පරිශීලකයන් හට ජාතික මට්ටමේ, පළාත් මට්ටමේ, දිස්ත්‍රික් මට්ටමේ හා ප්‍රාදේශීය මට්ටමේ දත්ත හා තොරතුරු වෙත පිවිසීමට අවකාශ සැළසේ.

4.3 රැස්කරනු ලබන දත්ත සඳහා ප්‍රවේශය ලබා දීමේ දී ඒ සම්බන්ධයෙන් වගකීම දරන නිලධාරීන්ට පමණක් එම අයිතිය ලබා දීමට සහ පුද්ගලික දත්ත ආරක්ෂක නෛතික විධිවිධාන යටතේ දත්ත හුවමාරු කර ගැනීමට කටයුතු කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතු ය.

5. මෙහි දී දැනට 'ඉ-ග්‍රාම නිලධාරී' ව්‍යාපෘතිය හා රජයේ සෙසු නිල දත්ත එකතු කිරීමේ ව්‍යාපෘති මඟින් ආවරණය වන දිස්ත්‍රික්ක/ප්‍රා.ලේ. කොට්ඨාශ වේ නම්, එකී දත්ත පද්ධතීන් සමඟ ද මනා සුසංයෝගයෙන් යුතුව වඩාත් අර්ථාන්විත දත්ත පද්ධතියක් සංවර්ධනය සඳහා කටයුතු කරනු ලැබේ.

6. මෙම මාර්ගගත "ජාතික සම්පත් පැතිකඩ" ජනාධිපති ලේකම් කාර්යාලයේ ප්‍රජා කටයුතු අංශය හා මුදල් ආර්ථික ස්ථායීකරණය සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ඒකාබද්ධව නිර්මාණය කර ඇත. මෙම කාර්යය ජාතික මට්ටමෙන් සම්බන්ධීකරණය හා පහසු කරන වැඩ පිළිවෙල ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක වන අතර දිස්ත්‍රික් හා ප්‍රාදේශීය වශයෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ක්‍රියාත්මක කිරීමේ වගකීම දරනු ලබයි.

**නීල් බණ්ඩාර හපුහින්න**
**ලේකම්**
**රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය**

**පිටපත්:**

1. සියළුම පළාත් ගරු ආණ්ඩුකාරවරුන්
2. ජනාධිපති ලේකම්
3. අග්‍රාමාත්‍ය ලේකම්
4. අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
5. සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
6. සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්
7. සියලුම ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්
8. විගණකාධිපති